# අනිවාර්ය අධ්‍යාපනය ලබාදීමේදී, දුෂ්කර පාසල් මුහුණදෙන ගැටළු පිළිබඳ අධ්‍යයනයක් (කුරුණෑගල දිස්ත්‍රික්කය ආශ්‍රයෙන්)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන
දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන නිබන්ධනය

UCLIB
493068

යූ.පී.විමලසිරි
**B.A. Diploma in Education,M.Ed**

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
2000.06.09

## සංක්ෂිප්තය

අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්ති වෙත නැඹුරුවීම තුළින්. පොදු අධ්‍යාපන අවස්ථා ව්‍යාප්ත කිරීමේ ප්‍රයත්න කෙරෙහි දැඩි අවධානය මෙකල විශේෂ ලක්ෂණයකි. මේ අතර ග්‍රාමීය දුරස්ථ ප්‍රදේශයන්හි අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලැබිය යුතු ජන සමූහයෙන් බහුතරයකට එම අයිතීන් සීමාවන බවක් දක්නට තිබේ. ආර්ථික හා සමාජ සංවර්ධන ක්‍රියාදාමයන්හිදී, මානව සම්පත් හිඟය සපුරාලීම සඳහා අධ්‍යාපනයට අනුගත වීමේ අවස්ථා වඩාත් බහුල වියයුතු බව පිළිගෙන තිබේ.

මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදයෙන්, විධිමත් පාසල් අධ්‍යාපනයේ මේ දක්වාවූ විකාශනයද, ඊට අදාළ නීතිරීති ස්ථාපිතවීම් හා පොදු එකඝතාවයන් මෙන්ම, ඒ සම්බන්ධ ක්‍රියාමාර්ගවලදී පැන නැගෙන බාධක හා අවහිරතා විමර්ශනය කරන ලදි. අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී, ශ්‍රී ලංකාව තුළ පවතින දුෂ්කරතා, ඒවා මගහරවා ගැනීම පිණිස ගෙන ඇති විවිධ ප්‍රයත්න, විස්තර කොට තිබේ.

දෙවන පරිච්ඡේදය තුළ, ග්‍රාමීය දුෂ්කර පාසල් පද්ධති සම්බන්ධ ව මෑත කාලීනව මෙහෙයවන ලද අධ්‍යයන ඇතුළත් වේ. ආර්ථික දුබලතාවය ග්‍රාමීය ප්‍රජාවේ නොහැකියා සමූහගත කිරීමට ආධාර වී තිබෙන බවත්, අධ්‍යාපනය පිළිබඳ යහපත් ආකල්ප ප්‍රජාව තුළ පැවතියද, අධ්‍යාපනය ලබාගැනීම පිළිබඳ දුෂ්කරතා පවතින බවත් දක්වා තිබේ.

නිදහස් ආර්ථික ප්‍රතිපත්තිවල අනිෂ්ඨ ප්‍රතිවිපාක හා ග්‍රාමීය නිරක්ෂර භාවය හේතුවෙන්, පාසලේ විධිමත් අධ්‍යාපනයට සිදුවන අහිතකර ස්වභාව හඳුන්වා තිබේ. පාසල් කාර්ය භාරය දැඩි ලෙස අවධාරනය වුවද, සාපේක්ෂව ග්‍රාමීය ප්‍රදේශවල ඒ

සඳහා බාධක පවතින අතර, ප්‍රාදේශිකව පවතින දුෂ්කරතාවයන් වෙනත් ගැටලුවලට පාදක වී ඇති බවත්, එම අධ්‍යයන තුළින් දක්වා තිබේ.

තුන්වන හා හතරවන පරිච්ඡේදවලින්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප හයට අයත් ග්‍රාමීය දුෂ්කර පාසල් 30 ක නියැදියක් ඇසුරින්, ඒවායේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පවතින යථාතත්ත්ව හා ඒවාට ආවේනික ගැටලු හා දුබලතා විස්තර වේ.

පාසලේ බාහිර පරිසරය, පාසල් පරිපාලනය හා පන්ති කාමරයේ දෛනික ක්‍රියාවිධීන් විමර්ශනය කර ඇති අතර, භෞතික, මානව හා මූල්‍ය සම්පත්වල පවත්නා ස්වභාවය නිරීක්ෂණය කරන ලදී.

විදුහල්පති හා ගුරුභූමිකා, පාසල් ප්‍රජාවේ ප්‍රතිචාර සහ ක්ෂේත්‍ර තුළ, ශිෂ්‍ය කාර්ය සාධනයට එරෙහිවන සාධක විමර්ශනය කරන ලදී. ජනපද ආශ්‍රිත පාසල් ළමුන්ගේ සමාජ ආර්ථික පසුබිම්වල පවතින දුබලතා මෙන්ම, ප්‍රාදේශීය දුෂ්කරතාවයන්ද ඇතුළු සමාජ ගැටලු ශිෂ්‍යයන්ගේ විධිමත් අධ්‍යාපනයට බලපා ඇති ආකාරය විමර්ශනය කරන ලදී. පාසලේ පිහිටීම කාර්ය මණ්ඩල වෙත පවතින අපහසුතා ඒකරාශි වී, පාසල පසුගාමී වන අයුරු විග්‍රහ කරන ලදී.

පස්වන පරිච්ඡේදයෙන්, ග්‍රාමීය දුෂ්කර පාසල්, පරිපාලන තලවල අධීක්ෂණයට, නිරීක්ෂණයට හා අවධානයට යොමුවන අවස්ථා අල්පවීම නිසා, දුරස්ථ ප්‍රදේශවල කුඩා පාසල්වල, තත්ත්වය, අපේක්ෂිත මට්ටම් වලට වඩාත් පහළ මට්ටම් නියෝජනය වන බවද, දුෂ්කර පාසල්වල, අධික ශිෂ්‍ය ජනගහන සහිත නාගරික ජනප්‍රිය පාසල්වල මෙන් කළමනාකරණ හා පරිපාලන ගැටළු නොමැති වුවද, පාසලෙන් සපයන අනිවාර්ය විධිමත් අධ්‍යාපනයේ ගුණාත්මකය වර්ධනය උදෙසා දැඩි කැපවීමක් අවශ්‍ය බව දක්වන ලදී,